# පලතුරුවල කාලීන මිල හැසිරීම හඳුනා ගනිමු

කෘෂිකර්මාන්තය තුළ ප්‍රධාන ආහාර බෝගවලට අමතරව ඉහළ වැදගත්කමක් පලතුරු නිෂ්පාදනය හා අලෙවිය සඳහා හිමි වේ. පුද්ගලයන්ගේ දෛනික කැලරි අවශ්‍යතාවයන්ට මෙන් ම විටමින්, ප්‍රෝටීන් වැනි පෝෂ්‍ය පදාර්ථ සපුරා ගැනීමෙහි ලා පලතුරු පරිභෝජනය ඉහළ වැදගත්කමක් උසුලයි. වර්තමානයේ, විශේෂයෙන් ම නාගරික හා අර්ධ නාගරික ජනතාව පලතුරු පරිභෝජනය පිළිබඳව වැඩි නැඹුරුතාවයක් දක්වයි. අඩු මුදලකට තත්ත්වයෙන් උසස් පලතුරු ලබා ගැනීම සෑම පාරිභෝගිකයෙකුගේම අපේක්ෂාව වන අතර තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාගැනීම සෑම ගොවියකුගේ ම මූලික අරමුණ යි.

කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධයෙන් සලකා බැලීමේ දී එය ස්වභාවයෙන් ම කාලීන ව්‍යාප්තියක් පෙන්වයි. එනම්, අස්වනු නෙළන කාලයේ දී වෙළෙඳපොළ සැපයුම ඉහළ යන අතර අනෙකුත් කාලවල දී සැපයුම පහළ මට්ටමක පවතී. වෙළෙඳපොළ ඉල්ලුම කෙටි කාලයේ දී නො වෙනස් බැවින් මෙකී සැපයුම ඉහළ පහළ යාම මිල කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. වෙළෙඳපොළ මිල හැසිරීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම නිෂ්පාදකයින්ට, පාරිභෝගිකයන්ට මෙන් ම එකී කෘෂි නිෂ්පාදන අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා කර්මාන්ත කරුවන්ට ඉතා වැදගත්කමක් උසුලයි. අනෙක් අතින් මිල යනු අලෙවිකරණ ක්‍රියාවලියේ ස්වභාවය පෙන්නුම් කරන සංකේතයකි. එනම්, අලෙවිකරණ ව්‍යුහයේ හා ක්‍රියාකාරීත්වයේ යථා ස්වරූපය නැතහොත් අවසන් ප්‍රතිඵලය මිල මඟින් පෙන්වයි. මේ හේතුවෙන් වෙළෙඳපොළ මිල පිළිබඳව සමාජයේ වැඩි අවධානයක් යොමු වෙයි. න්‍යායාත්මකව මිල හැසිරීම පිළිබඳව විග්‍රහ කිරීම සඳහා විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කළ ද, මෙම ලිපියේ දී ඉන් එක් ක්‍රමෝපායයක් වන කාලීන මිල හැසිරීම පිළිබඳව පමණක් අවධානය යොමු වේ.

ශ්‍රී ලංකාවේ තෝරාගත් පලතුරු වර්ග කිහිපයක කාලීන මිල හැසිරීම හා ඊට බලපෑ හේතු පිළිබඳව විග්‍රහයක යෙදීම මෙම ලිපියෙහි අරමුණ යි. කෙසෙල්, අඹ, අන්නාසි, දිවුල්, පැපොල් හා අලිගැටපේර යන පලතුරු මෙම විග්‍රහය සඳහා තෝරා ගැනේ.

පෙර සඳහන් කළ පරිදි කෘෂි නිෂ්පාදන කාලීන ව්‍යාප්තියක් පෙන්වන අතර සැපයුම ඉහළ-පහළ යාමත් සමඟ මිල උච්චාවචනයට ලක් වේ. මෙකී මිල උච්චාවචනයන් කාලීන මිල දර්ශකය භාවිතයෙන් විග්‍රහ කළ හැකි ය. මේ සඳහා තෝරාගත් පලතුරු වර්ගයන් හි 2001 සිට 2010 වසර දක්වා වසර දහයක තොග හා සිල්ලර මිල ගණන් භාවිතයට ගෙන තිබේ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවිකරණ, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය සතිපතා ප්‍රකාශයට පත් කරනු ලබන මිල තොරතුරු මේ සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත. කාලීන මිල දර්ශකය සැකසීමේ දී අදාළ වසර දහයෙහි මිලෙහි සාමාන්‍ය අගය ගෙන එකී සාමාන්‍ය අගය සියයට සමාන කොට එතැන් සිට මාසිකව මිල ගණන් කොපමණ දුරස්ථතාවයක් පෙන්වන්නේ ද යන්න ගණනය කර ඇත. සියයට වඩා අඩු දර්ශක අගයන් මඟින් අදාළ කාලයෙ හි මිල ගණන් වාර්ෂික සාමාන්‍ය අගයට වඩා පහළ යාමත් ඉල්ලුමට සාපේක්ෂව සැපයුමේ ඉහළ යාමත් පෙන්වයි. එමෙන් ම, සියයට වඩා වැඩි අගයක් මඟින් අදාළ කාලයන් හි මිල ගණන් වාර්ෂික සාමාන්‍ය අගයට වඩා ඉහළ යාමක් පෙන්වයි.

**වගු අංක 1**

**තෝරා ගත් පලතුරු වර්ග කිහිපයක තොග මිල සඳහා කාලීන මිල දර්ශකය (2001 - 2010=100)**

| මාසය | ඇඹුල් | කෝල් කූට්ටු | පැපොල් | අන්නාසි | කර්තකොලම්බන් | දිවුල් | අලිගැටපේර |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 113 | 101 | 110 | 92 | 81 | 90 | 146 |
| පෙබරවාරි | 87 | 89 | 144 | 87 | 153 | 105 | 125 |
| මාර්තු | 86 | 87 | 135 | 100 | 132 | 110 | 109 |
| අප්‍රේල් | 110 | 103 | 74 | 93 | 94 | 110 | 90 |
| මැයි | 78 | 84 | 59 | 87 | 66 | 111 | 81 |
| ජූනි | 79 | 89 | 79 | 93 | 69 | 133 | 85 |
| ජූලි | 99 | 100 | 110 | 113 | 103 | 145 | 95 |
| අගෝස්තු | 111 | 106 | 137 | 113 | 154 | 108 | 86 |
| සැප්තැම්බර් | 116 | 112 | 108 | 119 | 128 | 79 | 80 |
| ඔක්තෝබර් | 111 | 111 | 86 | 120 | 95 | 68 | 77 |
| නොවැම්බර් | 101 | 107 | 74 | 93 | 69 | 65 | 98 |
| දෙසැම්බර් | 106 | 110 | 84 | 90 | 57 | 77 | 136 |

**මූලාශ්‍රය : අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය - හෙ.ගො.ප.පු.ආයතනය**

තෝරාගත් පලතුරු වර්ග අතරින් කෙසෙල් පිළිබඳව සැලකීමේ දී එය ශ්‍රී ලාංකීය ජනතාව අතර ඉතා ප්‍රචලිත පලතුරක් වේ. එමෙන් ම, උත්සව අවස්ථාවන් හි දී අනිවාර්ය අංගයක් බවට පත් වී තිබේ. ගෘහස්ථ ආදායම්-වියදම් සමීක්ෂණය (2006/07) අනුව ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල කෙසෙල් පරිභෝජනය ගෙඩි 127ක් පමණ වෙයි. වගු අංක 01 මගින් කොළඹ තොග වෙළෙඳපොළෙ හි පැවති මිල ගණන් හි කාලීන ව්‍යාප්තියේ දර්ශක අගයන් පෙන්නුම් කරයි. එයට අනුව, ඇඹුල් කෙසෙල් මිල මැයි මාසය තුළ දී වාර්ෂික සාමාන්‍ය අගයට වඩා සියයට 22 කින් පහළ බසින අතර සැප්තැම්බර් මාසයේ දී එය සියයට 16 කින් ඉහළ නගී. පෙබරවාරි, මාර්තු, මැයි, ජුනි, ජූලි මාසවල මිල ගණන් වාර්ෂික සාමාන්‍ය අගයට වඩා පහළ යාමක් පෙන්වයි. විශේෂයෙන් ම මාර්තු, අප්‍රේල්, මැයි, ජුනි, ජූලි කාල පරාසය නිෂ්පාදනය ඉහළ කාල වකවානුව යි. සෑම වර්ෂයක ම දෙසැම්බර් අග හා ජනවාරි මුල නත්තල් හා නව අවුරුදු උත්සවය හේතුවෙන් කෙසෙල් ඉල්ලුම ඉහළ යන අතර පෙබරවාරි, මාර්තු වන විට ඉල්ලුම පහළ යාමක් පෙන්වයි. නිෂ්පාදනය ඉහළ මට්ටමේ පැවතිය ද අප්‍රේල් මස ඉහළ ඉල්ලුමත් සමග මිල ගණන්වල ඉහළ යාමක් පෙන්වයි. සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන් ඇඹුල් හා කෝලිකුට්ටු කෙසෙල් සඳහා ඉහළ ම මිල වාර්තා වන අතර නිෂ්පාදනයන් පහළ මට්ටමේ පවතී. ඇඹිලිපිටිය, හම්බන්තොට, මොණරාගල සහ යාපනය ප්‍රධාන කෙසෙල් සැපයුම් ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි ය.

පැපොල් පිළිබඳව සලකා බැලීමේ දී වසරේ කාල පරාස දෙකක දී මිල ගණන්වල පහළයාමක් පෙන්වයි. එනම්, අප්‍රේල් සිට ජුනි මෙන් ම ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරාසය යි. එම කාල පරාස දෙකට අනුව පහළ ම මිල මැයි හා නොවැම්බර් මාසවල දී වාර්තා වේ. ඉහළ ම මිල පෙබරවාරි හා අගෝස්තු මාසවල දී වාර්තා වෙයි. වගු අංක 1 මගින් පෙන්වන කාලීන මිල දර්ශකයට අනුව ගස්ලබු මිල සියයට 44ක් ඉහළට පෙබරවාරි මස හා සියයට 41 ක් පහළට මැයි මස දී යනා දී වශයෙන් මිල උච්චාවචනයන්ට ලක් වෙයි. විශේෂයෙන් ම, වැසි සහිත කාලගුණික තත්ත්වයන් තුළ දී ගස්ලබු සැපයුම ඉහළ යන අතර මේ හේතුවෙන් මිල ගණන් අඩු වෙයි. අනෙක් අතට පෙබරවාරි හා අගෝස්තු යන වියළි කාලගුණික තත්ත්වයන් පවතින කාල වකවානුවකි. මේ කාලය තුළ සැපයුම වේගයෙන් පහළ යන අතර මිල ගණන් ද ඉහළ යයි. ඇඹිලිපිටිය, පනාමුර, වැල්ලවාය, පුත්තලම, රාජාංගනය, අනුරාධපුර හා පොළොන්නරුව ප්‍රදේශ ප්‍රධාන ගස්ලබු සැපයුම් ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි අතර ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල පාරිභෝජනය ගෙඩි 6.48ක මට්ටමේ පවතී.

අන්නාසි පිළිබඳව සලකා බැලීමේ දී කොළඹ තොග වෙළෙඳපොළට ප්‍රධාන සැපයුම් ප්‍රදේශ ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ බැලුම්මහර, වැලිවේරිය, දිවුලපිටිය, කිරිඳිවැල ප්‍රදේශත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය හා අවට ප්‍රදේශයත් හඳුනා ගත හැකි ය. ජූලි සිට නොවැම්බර් දක්වා කාලීන මිල දර්ශක අගයන් වාර්ෂික සාමාන්‍ය අගයට වඩා ඉහළ මට්ටමක පවතින අතර මෙම කාල පරාසය තුළ සැපයුම පහළ මට්ටමක පවතී. විශේෂයෙන් ම, සැප්තැම්බර් හා ඔක්තෝබර් යනු ඉහළ ම මිල වාර්තා වන මාසයන් ය. පහළ මිල ගණන් අප්‍රේල්, මැයි කාලවකවානුව තුළ වාර්තා වන අතර එකී කාල පරාසය තුළ ඉහළ සැපයුමක් වාර්තා වේ.

අඹ අස්වනු වාර දෙකක් වසර තුළ හඳුනාගත හැකි අතර එය අප්‍රේල් සිට ජුනි දක්වා සහ ඔක්තෝබර් සිට ඊළග වසරේ ජනවාරි දක්වා යන කාල පරාසය තුළ ව්‍යාප්තව පවතී. අඹ වර්ග පිළිබඳව සැලකීමේ දී අස්වනු නෙළන කාල සීමාවන් දෙකක් වසර තුළින් හඳුනා ගත හැකි ය. අඹ වර්ග අතර ප්‍රධාන ගණයෙ හි ලා සැලකෙන කර්තකොලොම්බන් පිළිබඳ ව සැලකීමේ දී මැයි හා දෙසැම්බර් යනු අවම මිල ගණන් වාර්තා වන මාසයන් ය. අප්‍රේල් සිට ජූලි දක්වා හා නොවැම්බර්, දෙසැම්බර් හා ජනවාරි කාල පරාසයන් මිල ගණන් වාර්ෂික සාමාන්‍ය අගයට වඩා පහළ මට්ටමේ පවතී. මෙකී කාල වකවානු අඹ අස්වනු වෙළෙඳපොළට වැඩි වශයෙන් පැමිණීම මේ සඳහා ප්‍රධාන හේතුව යි. අනෙක් අතින් පෙබරවාරි, මාර්තු හා අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා දර්ශක අගයන් ඉහළ මට්ටමක පවතී. වැඩිම මිලක් පෙබරවාරි මාසය තුළ වාර්තා වී ඇත. විශේෂයෙන් ම, අඹ සඳහා ඉහළ මිල උච්චාවචනයක් පෙන්වන අතර වගු අංක 1 ට අනුව දර්ශක අගයන් පෙබරවාරි මාසය තුළ දී සියයට 47කින් ඉහළ ගොස් ඇති අතර දෙසැම්බර් මස දී එය සියයට 43 කින් පහළ බැස ඇත.

දිවුල් මිල පිළිබඳ ව සැලකීමේ දී පෙබරවාරි සිට අගෝස්තු දක්වා වාර්ෂික සාමාන්‍ය අගයට වඩා ඉහළ මිලක් වාර්තා වන අතර අනෙකුත් මාසවල දී පහළ මට්ටමක පවතී. අංක 1 වගුවට අනුව මිල උච්චාවචනය සියයට 44ක් ඉහළට හා සියයට 35ක් පහළට පරාසයක් තුළ විහිදේ. උපරිම දර්ශක අගය ජූලි හා අවම අගය නොවැම්බර් මස වාර්තා වෙයි. දිවුල් යනු ශ්‍රී ලංකාව තුළ ක්‍රමවත්ව කරනු ලබන වගාවක් නො වන අතර වියළි කලාපය තුළ මූලික

වශයෙන් ව්‍යාප්තව පවතී. මන්නාරම, හම්බන්තොට, පුත්තලම, මොණරාගල, අම්පාර හා පොළොන්නරුව ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ ලෙස ගැනේ. අලිගැටපේර දඩිවුල් මෙන් ම ශ්‍රී ලංකාව තුළ ක්‍රමවත්ව වගා නො වන අතර ප්‍රධාන වශයෙන් ගෘහාශ්‍රිත ව වගා කෙරේ. වගු අක 1 ට අනුව අලිගැටපේර සියයට 46ක් ඉහළට හා සියයට 20ක් පහළට මිල උච්චාවචනයක් වාර්ෂික සාමාන්‍ය අගයට සාපේක්ෂව පෙන්වයි. වසරේ මැයි සිට ඔක්තෝබර් දක්වා අස්වනු නෙළීම් සිදු වන අතර එම කාල පරාසය තුළ මිල ගණන් පහළ මට්ටමෙහි පවතී.

මේ ආකාරයට තෝරා ගත් පලතුරු වර්ග කිහිපයෙහි කාලීන මිල හැසිරීම විග්‍රහ කළ හැකි ය. ශ්‍රී ලංකාවේ පලතුරු වගාව පිළිබඳව සැලකීමේ දී කැපී පෙනෙන සාධකය වන්නේ කෙසෙල්. පැපොල්, අන්නාසි වැනි පලතුරු වර්ග කිහිපයක් හැර අනෙක්වා විධිමත් වගා රටාවන් තුළ සිදු නො වීමයි. බොහෝ දුරට ගෙවතු වගාවන් ආශ්‍රයෙන් සිදුවන වගා ක්‍රමයක් මේ අංශයෙන් කැපී පෙනේ. මේ හේතුවෙන් වෙළෙඳපොළ ඉලක්ක කරමින් වගාවන් සැලසුම් කිරීම පහළ මට්ටමක පවතී. ඉහත සඳහන් කළ කාලීන මිල හැසිරීම නිසි පරිදි හඳුනා ගනිමින් කටයුතු කිරීම තුළ ගොවීන්ට තම නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා ගැනීමේ හැකියාව මෙන් ම පාරිභෝගිකයන්ට තම තෘප්තිය ඉහළ නංවා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා ලැබේ. අනෙක් අතින් පලතුරු සැකසුම් කර්මාන්තයේ නියැළී සිටින නිෂ්පාදකයින් සැපයුම ඉහළ යන කාල පරාසයන් හඳුනා ගනිමින් වැඩි ප්‍රමාණයක් මිල දී ගැනීම තුළින් ලාභ උපරිම කර ගැනීමේ අරමුණු කරා ළඟාවීමේ හැකියාව පවතී. මේ අනුව, සෑම කෘෂි නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ම වෙළෙඳපොළ කාලීන මිල හැසිරීම හඳුනා ගැනීම ඉතා ඉහළ වැදගත්කමක් උසුලන බව පෙනී යයි.


එන්.පී.පී. සමන්ත

*පර්යේෂණ නිලධාරී*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.


## අස්වැන්න හරි සාර......

සිරි අයියෙ මෙහෙ වරෙන්,

මගෙ පපුව හරි සුවෙන්

කිරි වැදිල බණ්ඩිය ම,යාය මගෙ දෙකේ ඇළෙ

සුවඳැල් ලු, හීනටි ලු, මා වී ලු,ඇල් වී ලු

පැරණි වී හරි හොඳ ලු කීවා ඒ මහත්තැන්

මං වැව්වා හරි සැකෙන්,හොඳ වෙයිද නැති වෙයි ද

ශ්‍රී ක්‍රමේ මට ලැබුණු උපදෙසක් කෘෂිකර්මේ කොළ

පොහොර,ගොම පොහොර මං දැම්ම පිළිවෙළට

අපි වෙමු ද සහයෝගෙ එළවන්ට පණුවන්ව

එක් බද්ධ පළිබෝධ,හරි හොඳ ලු යායට ම

නෙළමු අපි අස්වැන්න මේ යලට එන මහට

වත්සලා ගමගේ

## අඩහැරය

මුදුනෙහි වූ මවු රජුනේ
ඊළඟ කිරි බුද්ධියනේ
වට දුවනා නාම්බනේ
කොළ මඩවා දෙන් සොඳිනේ

ඕ..... හෝ.... හෝ.......... හෝ.......හෝ....
ඔව්. ඕ... බා.. චොඩි
ඕ..වෝ.වෝ. බුදුවැල්ලා
කිරි බුදියන ඕ වෝ වො
ඕ. වෝ වො..
මුදුනේහි රජ මවු දෙනුනේ
ඊළඟ සොඳ කිරි මව්නේ
කලතේ වසු වැස්සියනේ
කොළමඩවා දෙන් සොඳිනේ

ඕ... හෝ... හෝ... ඕව ඕ
වෝ වෝ... බුදුවැන්නාත් කර
වල්ලි අම්මා ඕ... වෝ... වෝ... ඕ...

රත්නපුර පඹහින්න ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර එකමුතුවේ කමත චාරිත්‍ර වාරිත්‍ර ප්‍රකාශනයෙන් උපුටා ගැනීමකි.